## සමාජීයවිද්‍යා පීඨය හා මානවශාස්ත්‍ර පීඨය - කැලණිය විශ්වවිද්‍යාලය

## කොවිඩ් -19 විශේෂ තත්ත්වය යටතේ පවත්වනු ලබන උපාධි පරීක්ෂණ (ශාස්ත්‍රවේදී/ ගෞරව) පිළිබඳ තොරතුරු සහ උපදෙස් සංග්‍රහය -2021 පෙබරවාරි-අප්‍රේල්

මෙම විශේෂිත තත්ත්වය යටතේ විවිධ අභියෝගයනට මුහුණදෙමින් විභාගය සඳහා පෙනී සිටින විද්‍යාර්ථීන් සැමදෙනාම සාදරයෙන් පිළිගනිමු. එසේම ඔබට නිරෝගීව සාර්ථක ලෙස විභාගයට මුහුණදීමට සියලු ශක්තිය ලැබේවායි පතමු.

මෙම අවස්ථාවේ විද්‍යාර්ථීන් වන ඔබ මෙන්ම ආචාර්යවරුන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය වන අපද, කොවිඩ්-19 වසංගතය හමුවේ පවතින අවදානම් තත්ත්වය හොඳින් හඳුනන අතරම, ඒ තත්ත්වය යටතේ කටයුතු කිරීමේ අවදානම පිළබඳව චකිතයකින් පසුවන නමුත්, විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් වන තරුණ ඔබේ ඉදිරි ජීවිතය ආපස්සට ඇදීමකින් තොරව මේ අභියෝගය මධ්‍යයේ වුවද ඔබේ අධ්‍යයන කටයුතු සාධාරණ හා ආරක්ෂිත අයුරින් අවසන් කිරීමට අපි කැපවී සිටින බව පවසනු කැමැත්තමු. මේ දුෂ්කර අවස්ථාව පසුකිරීමට ඔබට හැකි සෑම උපකාරයක්ම කිරීමටත් ඔබ ආරක්ෂා කරගෙන ඔබේ විභාග කටයුතු නියමිත පරිදි අවසන් කිරීමටත් අප සියලු දෙනා අපගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් කැප වන්නෙමු. මෙම විශේෂිත තත්ත්වය යටතේ විභාගය පැවැත්වීමේදී ඔබත් අපත් සෑම අයෙකුම ආරක්ෂා විය යුතුව ඇති බවත් ඒ සම්බන්ධයෙන් අප සැමදෙනාටම තනිතනිව මෙන්ම පොදුවේ වගකීමක් ඇති බවත් අප දන්නා අතරම, ඒ බව රටේ වගකිව යුතු තරුණ පුරවැසියන් වශයෙන් ඔබත් මැනවින් දන්නා බව අපි තරයේ අදහන්නෙමු.

මෙම තොරතුරු සහ උපදෙස් සංග්‍රහය, විභාගය පැවැත්වීමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ඔබට අවශ්‍ය සියලු තොරතුරු ලබාදෙන අතරම මෙම විශේෂිත තත්ත්වය යටතේ විභාග අපේක්ෂකයන් වශයෙන් ඔබ විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය පිළිබඳ උපදෙස් මාලාවක්ද සපයනු ලැබේ.

### (01) ආරක්ෂිත පියවර

විද්‍යාර්ථීන්ගේ සෞඛ්‍ය තත්ත්වය හා කොවිඩ්-19 වැළඳීමෙන් වැළකීම සඳහා අනුගමනය කිරීමට නියමිත පූර්ව-ආරක්ෂණ ක්‍රියාවලියට අදාළ කරගත යුතුව ඇති දත්ත ලබාගැනීම සඳහා පහත සඳහන් පියවර මේ වනවිටත් අනුගමනය කොට ඇත.

### 1.1. පොදු පියවර

- විද්‍යාර්ථීන්ගේ තොරතුරු ලබාගැනීම සඳහා අදාළ ගූගල් ආකෘති පත්‍රය පළමු වර ඔබ වෙත එවා නැවත ලබාගෙන ඇති අතර, දෙවනවරටද එම ආකෘති පත්‍රයම ජනවාරි 28 වනදා උඩුගත කොට මේ වනවිට ඔබේ ප්‍රතිචාර ලබාගෙන ඇත.
- එම ආකෘති පත්‍ර සියල්ල ප්‍රධාන වෛද්‍ය නිලධාරීතුමාගේ නිර්දේශ සඳහා ඉදිරිපත්කොට ඇත.
- **මෙම ගූගල් ආකෘති පත්‍ර ලබාදෙන තොරතුරු, විද්‍යාර්ථීන් විශ්වවිද්‍යාලයට පැමිණි විට වෙන්කොට තැබීම (isolation) හා වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීම ආදී පියවර ගැනීම**

**පිණිස යොදාගැනේ. මෙහිලා විශ්වවිද්‍යාලයීය ප්‍රධාන වෛද්‍ය නිලධාරීතුමාගේ තීරණය අවසන් තීරණය බව කිව යුතුයි.**

- **හදිසි අවස්ථාවක් පැනනැගුණහොත් විද්‍යාර්ථියෙකු වෙන්කොට තැබීම සඳහා වෙනම නේවාසිකාගාර දෙකක් සූදානම් කොට ඇත.**

- **එසේම එබඳු අවස්ථාවක අවශ්‍ය වුවහොත් භාවිත කිරීමට පීඨ දෙකේම වෙනම විභාග ශාලාද සූදානම් කොට ඇත.**

- විශේෂ අවශ්‍යතා සහිත විද්‍යාර්ථීන් සඳහා වෙනම විභාග ශාලා වෙන් කොට ඇති අතරම ඔවුන් සඳහා වෙනම නේවාසිකාගාර පහසුකම්, ප්‍රවාහනය සඳහා වෙනම පහසුකම් හා විභාග ශාලාවට කැඳවාගෙන යාමේ සිට ඔවුන්ට සහයෝගය දැක්වීමට වෙනම ආචාර්යවරුන් කණ්ඩායමක් සංවිධානය කොට ඇත.

- විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරීතුමා විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලබන ශිෂ්‍යයන් සඳහා පමණක් Rapid Antigen (ක්ෂණික ප්‍රතිදේහ) පරීක්ෂණය සිදුකෙරෙනවා ඇත. ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම් අප සතුව ඇත.

- **ඔබ, අප සියලුදෙනාගේ ආරක්ෂාව උදෙසා අහඹු ලෙස මෙම පරීක්ෂණ සිදුකිරීම සඳහා ඔබට කැඳවීමක් ලැබුණු අවස්ථාවකදී කිසිදු පසුබෑමකින් තොරව ඒ සඳහා ඉදිරිපත්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.**

- තවද, හදිසි අවශ්‍යතාවකදී වෛද්‍ය මධ්‍යස්ථානයේ වෙන්කොට තැබීමේ පහසුකම් මෙන්ම එබඳු ශිෂ්‍යයන් වෛද්‍ය මධ්‍යස්ථානය කරා ගෙන යාමට ප්‍රවාහන පහසුකම්ද සූදානම් කොට ඇත.

**අවධාරණය කළ යුතුයි,**

- වෙන් කොට තැබීම යන්නෙන් කොවිඩ්-19 ආසාදිතයෙකු බවක් නොහැඟ වේ.

- සාමාන්‍ය උණ, හෙම්බිරිස්සාව ආදී තත්ත්වයන් සහිත ශිෂ්‍යයන්ද වෙන්කොට තැබීමට කටයුතු කරනුයේ පූර්ව ආරක්ෂිත පියවරක් වශයෙනි.

## 1.2. විභාග පැවැත්වෙන අවස්ථාවට අදාළ ආරක්ෂිත පියවර

- විභාග ශාලාවල වායුසමන යන්ත්‍ර වෙනුවට විදුලි පංකා ක්‍රියාත්මක කොට, ජනෙල් විවෘතකොට තැබේ.

- පේළි අතර මීටරය ඉක්මවා පරතරයක් තබා විභාග ශාලාව සූදානම් කොට ඇත.

- සෑම සැසියක් අවසානයේම මේස, පුටු ආදී සියල්ල විෂබීජානුහරණය කෙරේ.

- විභාග ශාලාව තුළ සේවය කරන අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය PPE (Personal Protective Equipment) කට්ටල/Face Shield, මුඛ ආවරණ හා අත්වැසුම් පැළඳ සිටිනු ඇත.

- **රෝගී තත්ත්වයක් වාර්තා වන හෝ නිරෝධායන කාලය ගෙවන හෝ කිසිදු අයෙකු විභාග කටයුතුවලට සම්බන්ධ කර නොගැනේ.**

- විභාග ශාලා පිහිටි පරිශ්‍රයේ වැසිකිළි නිරතුරුවම විෂබීජානුහරණයට ලක් කෙරේ. එම කාර්යය සඳහා සෑම වැසිකිළියකටම නිශ්චිත පවිත්‍රතා කාර්ය මණ්ඩලයක් යොදාගැනෙන අතර, ඔවුන් අවශ්‍ය ආරක්ෂිත උපකරණ පැළඳ සිටිනු ඇත.

- ආහාර ගැනීම සඳහා අවශ්‍ය නම් තෝරාගත් ස්ථාන කීපයක් ඒ සඳහා වෙන් කොට ඇත.

- සාමාන්‍යයෙන් සිදුවන පරිදි විශ්වවිද්‍යාලය තුළ භෝජනශාලා විවෘත කොට නොතැබෙන අතර, ආහාර පාර්සල් වශයෙන් පමණක් විකිණීමට භෝජනශාලා දෙකකට ('හිල්ටන්' සහ 'ස්ටාෆ්') අවසර ලබාදී ඇත. කෙසේවෙතත් එම ස්ථානවල සිට ආහාර ගැනීමේ පහසුකම් සලසා නැත.

- පීඨ පරිශ්‍රයේ ඇති ජල පෙරන යන්ත්‍ර ක්‍රියාත්මකව ඇතත් තමා සඳහා වෙනම වතුර බෝතලයක් රැගෙන ඒම වඩාත් සුදුසු වේ.

- **කිසියම් විද්‍යාර්ථියෙකු විභාගය අවස්ථාවේ රෝගී තත්තවයක් පෙන්නුම් කළහොත් (එය කොවිඩ්-19 රෝග ලක්ෂණ නොවන අන් කවර හෝ ලක්ෂණයක් වූ විටෙක පවා) සාමාන්‍ය පුරුදු ක්‍රමයට ආචාර්යවරුන්ගේ වාහන හෝ පොදුවේ විභාග කටයුතු සඳහා භාවිත කරන වාහන භාවිත කොට විද්‍යාර්ථියා වෛද්‍ය මධ්‍යස්ථානයට රැගෙන යාම සිදු නොවේ. අදාළ විද්‍යාර්ථියා විභාග ශාලාව තුළ අන්‍යයන්ගෙන් හැකිතාක් ඈත් කොට තබා (සෑම ශාලාවකම ඒ සඳහා ස්ථානයක් හඳුනාගෙන වෙන් කොට ඇත), වහාම ප්‍රධාන වෛද්‍ය නිලධාරීතුමාගේ උපදෙස් පැතීම සිදු කෙරේ. ඉක්බිතිව, ඒ කාර්යය සඳහා සූදානම් කොට ඇති ප්‍රවාහන පහසුකම් භාවිත කොට විද්‍යාර්ථියා වෛද්‍ය මධ්‍යස්ථානයට රැගෙන යනු ඇත.**

**ඔබ සතු වගකීම්**,

- ඔබ අමතා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරීතුමා කරන ප්‍රකාශයට සවන් දෙන්න. එසේම මෙම තොරතුරු හා උපදෙස් සංග්‍රහය හොඳින් කියවා අවබෝධ කරගන්න.
- නේවාසිකාගාර පහසුකම් ඉල්ලා ඇති විද්‍යාර්ථීන් 2021 ජනවාරි 31 වන දින නේවාසිකාගාර වෙත පැමිණිය යුතුයි. **විභාගය දින ඇතිවිය හැකි තදබදය හා ගැටළු අවම කරගැනීම සඳහා 31 දිනම නේවාසිකාගාර කරා පැමිණීමට වගබලා ගන්න.**
- **යම් හෙයකින් ඔබට නේවාසිකාගාර පහසුකම් ලැබී ඇති බව දන්වා තිබියදීත් බැහැර සිට විභාගයට පැමිණීමට ඔබ තීරණය කළහොත් ඒ බව වහාම ශිෂ්‍ය සේවා අංශයට දනුම් දෙන්න.**
- මේ වනවිටත් නේවාසිකාගාර පහසුකම් ලැබී නැති හෝ මේ වනතුරු අයදුම් නොකළ විද්‍යාර්ථීන් ඒ සම්බන්ධයෙන් වහාම ශිෂ්‍ය සේවා අංශය අමතන්න.

- නේවාසිකාගාර පහසුකම් අවශ්‍ය සියලු විද්‍යාර්ථීන්ට ඒ අවස්ථාව ලබාදීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.
- **නේවාසිකාගාරවල නවාතැන් නොගෙන විශ්වවිද්‍යාලයෙන් බැහැර සිට විභාගය සඳහා පැමිණෙන සියලු විද්‍යාර්ථීන් සඳහා වෙනම විභාග ශාලාවක් වෙන්කර ඇති බව කරුණාවෙන් සලකන්න. ඔබ විභාගය පැවැත්වෙන අදාළ පරිශ්‍රයට ඇතුළුවනවිටම බැහැර සිට පැමිණෙන බව ශිෂ්‍ය උපදේශකයන්ට දැනුම් දීම මගින් අවම වෙහෙසක් හා කාලයක් ගෙන ඔබ අදාළ විභාග ශාලාවට යොමු කිරීම අපට පහසුවනු ඇත.**
- නේවාසිකාගාරවලට පැමිණි අවස්ථාවේ සිට නැවත විභාග අවසන් කොට පිටත්ව යන තෙක්ම විශ්වවිද්‍යාලය විසින් නිර්දේශ කොට ඇති ආරක්ෂිත පියවර නිසිපරිදි හා වගකීමෙන් යුතුව අනුගමනය කරන්න -
- **ඔබ බැහැර නවාතැනක/තමන්ගේම නිවසේ/ඥාති හිතවත් අයෙකුගේ නිවසේ සිට පැමිණෙන්නේ නම් අදාළ ස්ථානයේ භාරකරු හෝ ගෘහමූලිකයාගේ නම/ලිපිනය/දුරකථන අංකයක්/ඔබගේ භාරකරුවෙකුගේ දුරකථන අංකයක්/ඔබේ ස්ථිර ලිපිනය යන මූලික තොතරතුරු සමග ඔබේ නම හා ශිෂ්‍ය අංකය සඳහන් A4 කඩදාසියක් සූදානම් කර ගන්න. විභාග ශාලාවට එය රැගෙනවිත් නිරීක්ෂකවරයෙකුට ඡායාරූපයක් ගතහැකි පරිදි මේසය මත තබන්න.**
- **කොවිඩ්-19 තත්ත්වය නොවන නමුත් විශේෂ සෞඛ්‍ය ආරක්ෂණ පියවර ගත යුතු රෝගයකින් ඔබ පෙළෙන්නේ නම් හෝ ගර්භණී විද්‍යාර්ථිනියක වේ නම් අදාළ වෛද්‍ය වාර්තාවල ඡායාරූප සමග ලිඛිත ඉල්ලීමක් ඡායාරූපයක් වශයෙන් ඔබගේ අංශයේ අංශ ප්‍රධානවරයාට whatsapp කරන්න.**
- **ඔබ විශේෂ අවශ්‍යතා සහිත විද්‍යාර්ථියෙකු නම් ඉහත ක්‍රමවේදයටම ඒ පිළිබඳව ඔබේ අංශ ප්‍රධානවරයාට දන්වන්න.** එසේම නේවාසිකාගාර සම්බන්ධයෙන් හා ඔබගේ සහායට පවුලේ අයෙකු පැමිණිය යුතු නම් එබඳු කරුණු සම්බන්ධව තොරතුරු හා උපදෙස් ලබාගැනීමට ශිෂ්‍ය සේවා අංශය අමතන්න.
- ඔබ ශාලාවට රැගෙන යා යුත්තේ ලිවීමේ උපකරණ සහ ශිෂ්‍ය හැඳුනුම්පත පමණි. ජංගම දුරකථනය ක්‍රියාවිරහිත කොට ඔබ සතුව තබාගත හැක. විනිවිද පෙනෙන ආකාරයේ පසුම්බි පමණක් ශාලාවට රැගෙන ආ හැකිය.
- විභාගය සඳහා අවශ්‍ය සියලු ලිවීමේ උපකරණ, වතුර බෝතල් ආදිය හුවමාරු කරගැනීමෙන් තොරව භාවිතය සඳහා තමන්ම රැගෙන එන්න.
- ආහාර ගැනීමේදී සෞඛ්‍ය ආරක්ෂණ කරුණු කෙරෙහි සැලකිලිමත්ව, එකම ආහාර පාර්සලය බෙදාගැනීම වැනි පුරුදුවලින් වැළකී සිටින්න.
- K ගේට්ටුවෙන් සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨ පරිශ්‍රයට ඇතුළු වූ ස්ථානයේ සිට අප විසින් රැගෙන ඇති ආරක්ෂිත පියවරවලට අනුගතව, සන්සුන්ව හා වගකීමෙන් යුතුව කටයුතු කරන්න (ධර්මාලෝක ශාලාවේ පැවැත්වෙන විභාග සඳහා පෙනී සිටින අපේක්ෂකයන්ද ඒ පරිශ්‍රයට ඇතුළුවීමේදී ක්‍රියාත්මක වන ආරක්ෂිත පියවරවලට අනුගත විය යුතුයි.).
- **මුඛ ආවරණ පැළඳීම, දැත් පිරිසිදු කිරීම හා මීටරයක පරතරය තබාගැනීම අනිවාර්ය බව සලකන්න.**
- විභාගය අවසන් වූ වහාම නේවාසිකාගාර කරා යන විද්‍යාර්ථීන් අදාළ බස්රථයෙන් හෝ වෑන් රියෙන් නේවාසිකාගාරය බලා පිටත්ව යා යුතු අතර බැහැර සිට පැමිණෙන විද්‍යාර්ථීන් පීඨ පරිශ්‍රයෙන් ඉවත්ව යා යුතුය.
- පුස්තකාලය පෙරවරු 9.00 සිට සවස 3.00 දක්වා විවෘතව පවතින අතර අවශ්‍ය ග්‍රන්ථ පරිශීලනය සඳහා ඔබට අවස්ථාව ලැබේ.
- **නිබන්ධ උපදේශකවරුන් හමුවීමට ඒ ඒ අංශය විසින් සකස් කොට ඇති සැලසුම ඔබට දන්වනු ලබන අතර ඊට අනුගතව කටයුතු කරන්න. ඔබේත් ආචාර්යවරුන්ගේ හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේත් ආරක්ෂාව තහවුරු කළ යුතු බැවින් අවශ්‍ය ඕනෑම අවස්ථාවක අධ්‍යයන අංශවලට හෝ ආචාර්යවරුන්ගේ කාර්යාල කාමරවලට ඇතුළුවීමට අවසර නොමැති බව කරුණාවෙන් සලකන්න.**

## (02) විභාග කාර්යපටිපාටිය

මුලින්ම පැවැත්වීමට නියමිතව ඇත්තේ ශාස්ත්‍රවේදී/ගෞරව අවසන් වසර පරීක්ෂණයි.

- මෙම කාලය තුළ විභාගයට පෙනී සිටින අවසන් වසර විද්‍යාර්ථීන් හැර අන් කිසිදු විද්‍යාර්ථියෙකුට විභාග පවත්නා පරිශ්‍රයට ඇතුළුවීම තහනම් බව කරුණාවෙන් සලකන්න.
- මේ කාලය තුළ වෙනත් විද්‍යාර්ථීන් උපදෙස්දීම් ආදී කටයුතු සඳහා ගෙන්වා නොගන්නා ලෙස ආචාර්යවරුන්වද දැනුවත් කරන බව කරුණාවෙන් සලකන්න.
- **අවසන් වසර විද්‍යාර්ථීන් අතුරින්ද සමාසික විභාග වෙනුවට වසර අවසාන විභාගයට පෙනී සිටින විද්‍යාර්ථීන් ඇතොත්, ඔවුන් ජනවාරි 31 දා සිට නේවාසිකාගාරවලට පැමිණීම හෝ පළමු සමාසිකයට අයත් විභාග පැවැත්වෙන කාලයේ විශ්වවිද්‍යාලයට පැමිණීම හෝ අවශ්‍ය නොවේ.**
- **පෙබරවාරි 10 වනදා ඔවුන් සඳහා උඩුගත කරනු ලබන ගූගල් ආකෘති පත්‍රය පුරවා, ඒවා මත පදනම්ව ප්‍රධාන වෛද්‍ය නිලධාරීතුමාගේ නිර්දේශය ලැබුණු පසුව, දෙවන සමාසිකයේ විභාග ආරම්භ වන දිනට පෙර දින ඔවුන්ට නේවාසිකාගාරයට පැමිණිය හැකියි.**

### 2.1. විභාගය පැවැත්වෙන කාලය

2021 පෙබරවාරි 1 සිට 24 දක්වා

<table>
<tr><th>දින</th><th>පාඨමාලාව</th><th>සමාසිකය</th></tr>
<tr><td>පෙබරවාරි 1 සිට 6</td><td>ගෞරව</td><td>I</td></tr>
<tr><td colspan="3"><ul><li>පෙබරවාරි 7 සිට 13 දක්වා දින 7ක කාලය දෙවන සමාසිකයේ විභාගයට පෙර ලබාදෙන අධ්‍යයන නිවාඩුව වශයෙන් සැලකිය යුතුයි. මේ කාලය තුළ නේවාසිකාගාර පහසුකම් ලබා ඇති විද්‍යාර්ථීන් නේවාසිකාගාරවලම රැඳී සිටිය යුතුයි.</li><li>මේ කාලය තුළ පුස්තකාලය විවෘතව ඇත. පුස්තකාල භාවිතය සඳහා මේ කාලය තුළ අවසර ලැබෙන්නේ නේවාසිකාගාරවල සිටින විද්‍යාර්ථීන්ට පමණි.</li></ul></td></tr>
<tr><td>පෙබරවාරි 14 සිට 19</td><td>ගෞරව</td><td>II</td></tr>
<tr><td>පෙබරවාරි 1 සිට 11</td><td>ශාස්ත්‍රවේදී</td><td>I</td></tr>
<tr><td>පෙබරවාරි 12 සිට 24</td><td>ශාස්ත්‍රවේදී</td><td>II<br>පෙබරවාරි 20 දින පෙරවරු සැසියෙන් සාමාජීයවිද්‍යා පීඨයේ විද්‍යාර්ථීන්ගේ සියලු විභාග කටයුතු අවසන් වේ.</td></tr>
</table>

## 2.2. විභාග පැවැත්වෙන වේලාවන් හා ශාලා

- සැසි දෙකකි: 1) පළමු සැසිය - පෙ.ව. 8.30 සිට 11.30

  2) දෙවන සැසිය - ප.ව. 3.30 සිට 6.00 හෝ 6.30

| ශාලා වර්ගය | ශාලා අංක | ශාලාවේ විභාගයට පෙනී සිටින විද්‍යාර්ථීන් කාණ්ඩය |
|---|---|---|
| A | Kekulawala or K-1/ K-2- 002/ K-27-001/ K-3-209/ F-9<br><br>F-4-201 – Social Sciences and Humanities<br><br>ශ්‍රී ධර්මාලෝක ශාලාව | නේවාසිකාගාරවල සිට පැමිණෙන වෛද්‍ය නිර්දේශ මත වෙන් නොකළ විද්‍යාර්ථීන් |
| B | K-27-102 / K-27-103 | විශ්වවිද්‍යාලයට බැහැර සිට එන විද්‍යාර්ථීන් |
| C | ඉතිහාස අධ්‍යයන අංශයේ දේශන ශාලාව / දර්ශන අංශයේ දේශන ශාලාව / ආර්ථිකවිද්‍යා අංශයට අයත් අංශය අසලම ඇති දේශන ශාලාව | විශේෂ අවශ්‍යතා ඇති විද්‍යාර්ථීන් |
| D | K-27-202 / K-27-203 | ප්‍රධාන වෛද්‍ය නිලධාරීතුමාගේ නිර්දේශය මත නේවාසිකාගාරවල වෙන්කොට තබා වෙනම බස් රථයකින් කැඳවාගෙන එන විද්‍යාර්ථීන් |

## 2.3. විභාග කාර්යපටිපාටිය

- K සහ F ගේට්ටු මෙන්ම ධර්මාලෝක ශාලාවට ප්‍රවිශ්ඨ වීමට යායුතු විද්‍යා පීඨ පරිශ්‍රයේ ගේට්ටුවෙන් ඇතුළු වන අවස්ථාවේදී උෂ්ණත්වය පරීක්ෂා කිරීම සිදුකරනු ලබන අතර අදාළ පරිශ්‍රයන් තුළ දෑත් සෝදාගැනීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත.

- **විභාගය ආරම්භවීමට පැය භාගයකට පෙර සිට ඕනෑම වෙලාවක ඔබට විභාග ශාලාවට ඇතුළු විය හැකිය.**

- විභාග ශාලාවට ඇතුළු වන අවස්ථාවේදී ඔබේ දෙඅත්වලට විෂබීජ නාශක දියර ඉසිනු ලැබේ.

- ඔබට නියමිත මේසය මත පිළිතුරු ලිවීම සඳහා භාවිත කෙරෙන පොත සහ අමතර කඩදාසි කීපයක් මෙන්ම එදිනට වලංගු ප්‍රවේශපත්‍රය තබා ඇත. ප්‍රවේශ පත්‍රයේ ඔබේ අත්සන තබා සූදානම් කරගන්න.

- **සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රම අනුගමනයේදී සිදුවන කවර හෝ පමාවක් නිසා ඔබට ශාලාවට ඇතුළුවීමට පමා වුවහොත් ඔබට නියමිත කාලයම පිළිතුරු ලිවීම සඳහා ලබාදෙන බැවින් කලබලවීම, තෙරපීම අවශ්‍ය නොවන බව සිහි තබා ගන්න.**

- නියමිත වේලාවට ශාලා නිරීක්ෂකයෙකු ඔබට අදාළ ප්‍රශ්න පත්‍රය බෙදනු ඇත

**පිළිතුරු පත් ආපසු බාරදීම**

- ඒ ඒ විෂයයට වෙන් කරන ලද පේළිය ඉදිරියෙන් විශාල පොලිතීන් කවරයක් හෝ පෙට්ටියක් විවෘත කොට තැබීම නැත්නම් පිළිතුරු පත් ඔතන කඩදාසිය දිගහැර තැබීම සිදුකරන අතර ඒ අසලින්ම එදිනට නියමිත ප්‍රවේශ පත්‍රය බහාලීමට කුඩා පෙට්ටියක්ද තබනු ලැබේ.

- කලින් විභාගය නිමකළ අයෙකුට පිළිතුරු පත්‍රය, අදාළ බහාලුමට දමා, ප්‍රවේශ පත්‍රය පෙට්ටිය තුළට දමා විභාග ශාලාවෙන් පිටව යා හැකිය.

- නියමිත වේලාවටම විභාගය ලියා අවසන් කළ විද්‍යාර්ථීන් දොරටු ආසන්නයෙන් ඇති පේළියේ සිට පටන්ගෙන වරකට එක් අයෙකු බැගින් පැමිණ පිළිතුරු පත්‍රය හා ප්‍රවේශ පත්‍රය අදාළ ස්ථානයට දැමීම කළ යුතුය.

- ඒ ඒ විෂයයේ නිරීක්ෂකවරයෙකු විසින් තමා සතු ලේඛනයේ අදාළ අපේක්ෂකයා පිළිතුරු පත්‍රය හා ප්‍රවේශ පත්‍රය බාරදුන් බව ලකුණු කර ගනු ලැබේ.

- සියලු අපේක්ෂකයන් ඉවත් වූ පසුව ඒ ඒ කවරය හා ප්‍රවේශ පත්‍ර පෙට්ටි විශේෂයෙන් සූදානම් කළ ස්ථානයේ තැන්පත් කෙරේ.

- නිබන්ධන හෝ පැවරුම් බාරගැනීමක් සිදුවේ නම්, විද්‍යාර්ථීයා ශාලාවට ප්‍රවේශ වන තැන තබා ඇති පෙට්ටියට එය දැමිය යුතු අතර ශාලා නිරීක්ෂකවරයෙකු අදාළ විද්‍යාර්ථීයා නිබන්ධය/පැවරුම **බා**රදුන් බව තමා සතුව ඇති නාම ලේඛනයේ ලකුණු කරගනු ඇත. එම පෙට්ටිය අදාළ අංශයේ වෙන් කරන ලද ස්ථානයක තැබීම සිදුවේ.

**කිසියම් විද්‍යාර්ථීයෙකු කොවිඩ් ආසාදිතයෙකු වීම/ආශ්‍රිතයෙකුව නිරෝධායනයට යටත්ව සිටීම/වෙනත් රෝගී තත්ත්වයක් ආදී නොවැළැක්විය හැකි හේතුවක් මත විභාගයට පෙනී සිටීමට නොපැමිණියහොත්, ඉදිරියේදී එබඳු විද්‍යාර්ථීන් සඳහා අතිරේක පරීක්ෂණයක් පවත්වනවා ඇත. එම පරීක්ෂණයද මෙම පරීක්ෂණය පවත්වන ආකාරයටම විද්‍යාර්ථීන් විශ්වවිද්‍යාලයට කැඳවා පැවැත්වීම කරන බවත් එම පරීක්ෂණයට පෙනී සිටින විද්‍යාර්ථීන් පළමුවරට අදාළ විභාගයට පෙනී සිටින සේ සලකනු ලබන බවත් අවධාරණය කරනු කැමැත්තෙමු. කෙසේ වෙතත්, එබඳු විභාගයක් පැවැත්වෙන දිනවකවානු නිශ්චිතව මේ අවස්ථාවේදී දැක්වීම ප්‍රායෝගිකව අපහසු කරුණක් වන බවද ඔබට දන්වනු කැමැත්තෙමු.**

මහාචාර්ය එම්. එම්. ගුණතිලක
පීඨාධිපති - සමාජීයවිද්‍යා පීඨය

සුදත් සෙනරත්
පීඨාධිපති - මානවශාස්ත්‍ර පීඨය